
# ඡායා රූ පිළිසඳර

2012 මාර්තු / අප්‍රේල්

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**

## අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම



සංගමයේ 2011/2012 අර්ධ වාර්ෂික මහසභා රැස්වීම 2012 ජනවාරි 29 වෙනි ඉරුදින නාරාහේන්පිට අංක 354/2, ස්ථානයේ පිහිටි නිපුණතා පියසේ දී පවත්වන්නට යෙදුනි. මෙයට ගරු අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සාමාජික විශාල පිරිසක් සහභාගි වූහ. පාඩම් කටයුතුවලට අදාළ ප්‍රශ්ණ කීපයක් මෙහිදී ඉදිරිපත් කෙරුණි. ප්‍රවීණ ජනමාධ්‍ය ඡායාරූප ශිල්පී කලා භූෂණ එල්.ඊ. සමරරත්න මහතා විසින් ප්‍රකාශයට පත් කරන ලද ‘Learn to See’ ග්‍රන්ථයේ පිටපතක් සංගමයට පරිත්‍යාග කළ අතර, එතුමාගේ අත්දැකීම් සම්මිශ්‍රණය වූ නවක ඡායාරූප ශිල්පීන්හට ප්‍රයෝජනවත් දේශනයකට සවන්දීමේ අවස්ථාව ද සහභාගි වූ සැමට උදාවිය. ශාලා පහසුකම් නොමිලයේ සපයාදුන් අප සාමාජික මේනක මහතාට සංගමයේ ස්තූතිය හිමිවේ.

## 'ඇයි හොඳයි' සාමාජික සුහද හමුව 2012

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ වාර්ෂික සුහද හමුව මෙවර, වාද්දුව 'රිවර් වීව්' හෝටලයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා සාමාජික ඔබ සැමගේ පවුලේ උදවිය සමග පැමිණ සහභාගි වන ලෙස ගෞරවයෙන් ඇරයුම් කර සිටින අතර, සංගමයේ පැරණි හා නවක සාමාජික සාමාජිකාවන් හට කලකට පසු මුණගැසී දැන හඳුනාගෙන ඇයි හොඳයි කම් පවත්වා ප්‍රීතිමත් දිනයක් ගත කිරීමට හැකි වෙතැයි සංවිධායක මණ්ඩලය අපේක්ෂා කරයි. නාන තටාකය, සාගර පරිසරය, සංගීතය, ප්‍රණීත ආහාර පාන ඇතුළු විනෝද වීමේ අවස්ථා රැසක් ඔබ වෙනුවෙන් සූදානම් ය. එක් අයෙකු සඳහා අයකිරීම රු. 1200/- කි. වයස අවුරුදු 10ට අඩු ළමුන් සඳහා අයකිරීමක් නැත. 2012 මාර්තු 25 උදේ 9.00 ට ආරම්භ වී සවස 4.00 දක්වා සුහද හමුව පැවැත්වීමට නියමිතය.

ඇතුළුවීමේ අවසර පත්‍ර පන්ති පැවැත්වෙන අවස්ථාවේ මහාබෝධි විදුහලේ දී සහ එදින දොරටුවෙන් ලබාගත හැකි ය. කොළඹ දෙස සිට පැමිණෙන විට පානදුර නගරය පසුවී පින්වත්ත පාලම අසල, ගාලුපාර අසලම රිවර් වීව් හෝටලය පිහිටා ඇත. ඔබගේ සාමාජික හැඳුනුම්පත රැගෙන එන ලෙස දැනුම් දෙන අතර, සියළු විමසීම් සමාජසේවා අධ්‍යක්ෂ, ප්‍රියන්ත අබේසුන්දර මහතා 0777416669 හෝ සංවිධායක කමිටුව වෙනුවෙන් තුෂාර 0773694094 විමසන්න.

## සාදරයෙන් පිළිගනිමු

නවක සාමාජික සාමාජිකාවන් සාදරයෙන් පිළිගනිමින් පෙබරවාරි මස 26 වැනි ඉරු දින නව වසරේ පන්ති ආරම්භ විය. සංගමයේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ සාමාජික පිරිසකගේ සහභාගිත්වයෙන් එය සිදු කෙරුණු අතර, 2012 වසර සඳහා සංගමයේ සාමාජිකත්වය ලැබූ පිරිස 198 දෙනෙක් බව අධ්‍යක්ෂ ලේඛකාධිකාරි හසිත ලියනගේ මහතා පිළිසඳරට පැවසීය. සිරිත් පරිදි ප්‍රථම දේශනය 'ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය හා එහි ගමන් මග' මැයෙන් තිලක වෙරළුපිටිය මහතා විසින් පවත්වන ලදී. නවක සාමාජික සාමාජිකාවන් ඇතුළු සැමට දෙවන වසර සිසු සිසුවියන් එක්ව මේ වනවිට අගනා සම්ප්‍රදායක් බවට පත්වෙමින් තිබෙන පිළිගැනීමේ සංග්‍රහය පවත්වන්නට ද යෙදුනි.

# ෆොටෝ ගන්න දොස්තර මහත්තයා

සිරිත් පරිදි මීගමුව වෙරළට සැඳෑ හිරු රැස් පතිත වන්නට වුනා. ඒත් වෙනදා එහි තිබෙන දීප්තිය, වර්ණවත් බව එහි දක්නට ලැබුනේ නෑ. තිබුනේ ශෝකාකුල බවක්. මෙතෙක් කලක් මීගමුව වෙරළේ හිරු උදාව මෙන් ම හිරු බැසයාමේ චමත්කාරය රසවිඳි, මීගමුව ජනතාවට අසීමිත ලෙස ආදරය කළ, එම ජනතාවට ජීවකයෙකු බඳුවූ සුන්දර මිනිසා, පරිසරවේදියා, ඒ වනවිට මෙලොව හැරගොස් තිබූ නිසාවෙනි.

මීගමුව අපට මතක්වන විට නිතැතින් ම සිහිපත්වන ඒ හා බද්ධවුනු නාමය දොස්තර එම්.එස්. වීරකෝන් නාමයයි. වෛද්‍ය වරයෙකු වුවත් චිත්‍ර ශිල්පයට හා ඡායාරූප ශිල්පයට එතුමා බෙහෙවින් ඇළුම් කළා. ඒ විතරක් නෙමෙයි ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවූ පොත් පත් විශාල සංඛ්‍යාවක් පරිශීලනය කළ සාහිත්‍යධරයෙක්. ඉංග්‍රීසි කවිවලින් පැවසෙන අදහස ඡායාරූපයකින් ඉදිරිපත් කරන්න ඔහුට හැකියාව තිබුනා. ඉතා දුර්ලභ ගණයේ කලු සුදු ඡායාරූප රැසක් එතුමා සතු වුනා. වසර 50කට පමණ ඉහත දී මෙම කලාත්මක විෂයට පිවිස තිබීම එයට හේතුවයි. මීගමුව අවට පමණක් නොව, දිවයිනේ කුමන පෙදෙසකින් වත් එදා එතුමා විසින් ගන්නා ලද සමහර ඡායාරූප පසු කාලවල දී වෙනත් ඡායාරූප ශිල්පීන් හට ලබා ගන්නට නොහැකි වුනා. එයට හේතුව ඉතාම කණගාටුදායක ආකාරයට පරිසරය වෙනස්වීම්වලට භාජනය වෙමින් පැවතීමයි. ඒ අනුව එතුමාගේ ඇතැම් ඡායාරූප ඒ ඒ වකවානු තුළ වාර්තා ඡායාරූප බවට පත්වෙනවා. උදාහරණයක් ලෙස වීරකෝන් දොස්තර මහතා විහාර මහා දේවි උයන තුළ එදා ගත් ඡායාරූපයක් අද වෙනත් කිසිදු කෙනෙකු හට ලබා ගන්නට බැහැ. පරිසරය හා ස්වරූපය හාත්පසින් ම වෙනස් වෙලා.

දොස්තර මහතාගේ වර්ණ ඡායාරූපවල ඔහුගේ අනන්‍යතාවය ගැබ්වී තිබුනා. කලකට ඉහත දින දර්ශන, ඡායාරූප ඇතුලත් දිනපොත්, සඟරා ආදියෙහි එම ඡායාරූප පලවුනා. ඒවා බොහොමයක් දීප්තිමත් වර්ණවලින් යුක්ත වූ අතර, ඇතැම් ඡායාරූප සෘණ එලක දෙකක් හෝ කීපයක් එකමත එක තබා මුද්‍රණය කරනු ලැබූ වෙනස් ආකාරයේ ඒවා වීම එයට හේතුවයි.

මීගමුවේ එම්.එස්. විරකෝන් නම් වෛද්‍යවරයා ගැන යමක් කියනවා නම්, ඔහුගෙන් ප්‍රතිකාර ලබා ගැනීමට එන රෝගීන් සමග බොහෝ වේලා කතා කරමින් සිටීම සිරිතක්. ඒ අදාළ රෝගය ගැන විතරක් නෙමෙයි. තවත් බොහෝ කරුණු ගැන ඔහු කතා කළා. ඇතැම් විට ඡායාරූප ගැනත් ඒ අයට කියාදෙන අවස්ථා තිබුනා. ඩිස්පැන්සරිය පුරාම දකින්නට තිබුනෙ එතුමා විසින් ගන්නා ලද දුටුවන්ගේ ඕනෑම අසනීපයකට මානසික වශයෙන් සුවයක් ලබාදෙන සුන්දර ඡායාරූප.

වසර ගණනාවක් පුරා අප සංගමයේ 'මීගමුව වෙරළ චාරිකාව' අතරතුර ඊට සහභාගී වන විද්‍යාර්ථීන් කැටුව වීරකෝන් මහතාගේ නිවසට හෙවත් කලාගාරයට යාම සිරිතක් ලෙස සිදු කෙරුණා. එම අවස්ථාවල දී එතුමාගේ ඡායාරූප නැරඹීම හා ඒවා පිළිබඳව එතුමා විසින් ම පවත්වන දේශනයකට සවන්දීමේ අවස්ථාව හා භාග්‍ය ඔවුන්ට උදාවුනා. කවුරුත් වඩාත් ආසාවෙන් නැරඹුවේ එතුමා සතු වර්ණ විනිවිදක (slides) එකතුව හා කලාත්මක නිරුවත් (nudes) ඡායාරූප එකතුවයි කීවොත් නිවැරදියි. ඔහු මෙන් කාන්තාවකගේ සිරුරේ හැඩතල හා රිද්මය පිළිබඳව ශාස්ත්‍රීයව හදාරන ලද වෙනත් කෙනෙකු නොමැති තරම්. වෛද්‍යවරයෙකු සතු වියයුතු හික්මීම, සංයමය මේ යැයි එතුමා එම ඡායාරූප තුළින් අපට නිහඬව තවත් පාඩමක් කියා දුන්නා.

මෙම සුන්දර, සාර්ථක මිනිසා පිටුපස සෙවනැල්ල මෙන් සිටි කාන්තාව පිළිබඳවත් සඳහනක් නොකර ම බැහැ. ලලිතා තෙරේසා සාවිත්‍රි වීරකෝන් මැතිණිය එතුමාගේ දයාබර බිරිඳයි. දොස්තර වීරකෝන් මහතා ඡායාරූප ශිල්පයට සිදුකළ දැවැන්ත මෙහෙවර පිටුපස අයෝමය හස්තය මෙන් එතුමිය සිටියා. මගේ පොලිස්කාරයා වශයෙන් අභිසංක විහිලුවකින් දොස්තර මහතා ඇයව හඳුන්වා දෙනවා. ඇගේ නිවසට පිවිසෙන සැමට තේ පැණින් කැවිලි ආදියෙන් සංග්‍රහ කරන්නට ඇය කිසිවිටෙක අමතක කළේ නැහැ. සහභාගීවන පිරිස සියය ඉක්මවුවත් ඒ සැමට ආදරයෙන් ඇය සත්කාර කළා.

ඉදිරි පරපුරට එතුමාගේ හඬින් ඡායාරූප හෝ සෘණඑලක ගැන විස්තර අසන්නට නොලැබීම ගැන ඇතිවෙන්නේ සංවේගයක්. ලයනල් වෙන්ඩ්ට්, ඇන්සල් ඇඩම්ස්, එඩ්වඩ් වෙස්ටන්, කාටියෙ බ්‍රෙසොන්, රෙනෝවා ආදීන් ගැන කියා දෙන්නට දැන් ඔහු අප අතර නෑ. ඒත් ඡායාරූප ශිල්පය පවතින තාක් කල් දොස්තර එම්.එස්. වීරකෝන් නාමය ඡායාරූප කලාවේ නියැලෙන්නන් තුළ නොනැසී පවතීවි. එතුමා සමාදානයේ සැතපේවා!

**සුනිල් ලියනගේ**

## හද ඇඳි සේයාරුව!



අමිලයි ඔබේ සෙනෙහස
අසමයි ඔබේ මනු ගුණ
අචලයි ඔබේ පිළිරුව
අප හද සදා නොමැකෙන

**සමස්ත ශ්‍රී ලාංකේය ඡායාරූප කලාවේදීන්ගේ උත්තමාචාරය!**

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය**

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
The National Photographic Art Society of Sri Lanka

# භෞතික හිමිකම් සහ වත්කම් පරිපාලනය

## අරමුණ
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය සතු සකලවිධ භෞතික හිමිකම් සහ වත්කම් ආරක්ෂා කොටගැනීමත්, ඒවායේ නිසි නඩත්තුව, ආරක්ෂාව සහ ඵලදායී පරිහරණයත් සම්බන්ධ විධිවිධාන පැනවීම මෙම චක්‍රලේඛයෙන් අරමුණු කෙරේ.

## අර්ථ නිරූපණය
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ නිෂ්පාදන, ඉදිකිරීම්, මිල දී ගැනීම්, ආනයනයන් සහ සංගමය වෙත කෙරුණු ප්‍රදානයන් මේ යටතේ ආවරණය වේ.

## නිල හිමිකම
සංගමයේ සියලු භෞතික දේපළවල නිල හිමිකම ප්‍රධාන පරිපාලන නිලධාරියා වන විධායක අධ්‍යක්ෂවරයා සතු ය. සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ම එකඟතාව පරිදි එම දේපළ පරිහරණය කළ යුතු අතර, විධායක අධ්‍යක්ෂවරයාගේ නියමය පරිදි ඒ පිළිබඳ අදාළ ලිපි ලේඛනාදිය පවත්වාගැනීම මුදල් අධ්‍යක්ෂ වෙත පැවරේ.

## නිර්දේශ
1. සංගමය වෙනුවෙන් යම් භෞතික දේපොළක් නිෂ්පාදනය, ඉදිකිරීම, මිල දී ගැනීම, ආනයනය හෝ පරිත්‍යාග වශයෙන් ලබාගැනීමට සෑම අධ්‍යක්ෂවරයකුට මත්, සාමාජිකයෙකුට මත් අයිතියක් ඇත. එහෙත් කිසියම් සාමාජිකයෙකු එවන් දේපොළක් ලබාගත යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ අනුදැනුම සහිත ව පමණි.

2. එකී දේපොළ ලබාගත් පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ විධායක අධ්‍යක්ෂවරයාගේ නියමය පරිදි තොග භාණ්ඩ ලේඛනයෙහි ලියාපදිංචි කළ යුතු ය.

3. වාර්ෂික මහා සභාවකින් පත්වන නව අධ්‍යක්ෂ මණ්ඩලය මසක් ඇතුළත තොග භාණ්ඩ පරීක්ෂා කර එහි වගකීම් භාරගත යුතු ය. පරීක්ෂාවේ දී කිසියම් අඩුවක් ඇති බව පෙනීගිය හොත් හෝ ගැටලු සහගත තත්වයක් මතුවුවහොත් ඒ සඳහා කලින් වසරේ විධායක අධ්‍යක්ෂවරයාගෙන් සහ/හෝ මුදල් අධ්‍යක්ෂවරයාගෙන් ඒ පිළිබඳ කරුණු විමසා ගැටලු නිරාකරණය කොට ගත යුතු වේ.

4. භාණ්ඩ හෝ දේපොළ අලුත්වැඩියාව පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය කෙරේ. ඊට අදාළ ප්‍රතිපාදන අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි සපයාගත හැකි ය.

5. තොග භාණ්ඩ ලේඛනයේ සඳහන් භාණ්ඩ කවර ස්ථානයක රඳවා තැබිය යුතු ද, කවර ආකාරයෙන් පරිහරණය කළ යුතු ද, නඩත්තු තත්වය කෙබඳු ද යන්න අධ්‍යක්ෂ මණ්ඩලයට අභිමත පරිදි තීරණය කළ හැකි ය.

6. සංගමය සතු භෞතික හිමිකම් සහ වත්කම් සෑම ආකාරයකින් ම වැඩිදියුණු කිරීම සහ ආරක්ෂා කිරීම සියලු සාමාජික භවතුන්ගේ යුතුකමයි.

7. සංගමය සතු භෞතික හිමිකම් සහ වත්කම් ඈවර කිරීම, පැවරීම, සහ විකිණීම පිළිබඳ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට සම්පාදනය කළ හැකි ය. එහෙත් එය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මහා සභාව දැනුවත් කළ යුතු වේ.

8. එසේ හිමිකම් සහ වත්කම් ඈවර කිරීමකින් ලැබෙන මූල්‍ය හෝ අන් කවර ආකාරයක හෝ ප්‍රතිලාභයක් වෙතොත් එය සංගමය සතු වේ.

## ප්‍රභා ලේඛිකා සංසදයේ නව නිළධාරි මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයට අනුබද්ධ ලංකා ප්‍රභා ලේඛිකා සංසදය නව නිළ මඩුල්ලක් පත්කර ගැනීම සඳහා 2012 මාර්තු මස 04 වන ඉරුදින කොළඹ මහබෝධි මහ විද්‍යාලයේ දී රැස්වූ අතර එහි සාමාජිකාවෝ පහත දැක්වෙන නිළධාරිනියන් එහි අභිනව ඉදිරි කටයුතු සඳහා පත් කර ගන්නා ලදී.

**නව නිළධාරි මණ්ඩලය**

| | |
|---|---|
| ප්‍රධාන සභාපතිනි | : තිනේෂා එදිරිසිංහ මෙනෙවිය |
| ප්‍රධාන ලේකම් | : ලසන්ති වීරක්කොඩි මෙනෙවිය |
| ප්‍රධාන භාණ්ඩාගාරික | : රත්නා විජේසිංහ මහත්මිය |
| උප සභාපතිනි | : රේඛා එන්.පී.අබේසිංහ මහත්මිය |
| උප ලේකම් | : එච්.කේ. ජයමිණී බුද්ධිකා මහත්මිය |

**කාරක සභාව**

රංජනී අරන්දර මිය, චම්පා දමයන්ති කුරුප්පු මෙය, නන්දනී හෙට්ටිආරච්චි මෙය, පූර්ණිමා තේනුවර මිය, ආර්.ඒ. නිමාෂා මෙය, හේමමාලි අල්විස් මෙය, සුමුදු ජයවර්ධන මෙය සහ අමන්දා සම්මානි මෙය. නව නිළ මඩුල්ලට පිළිසඳර සුභ පැතුම්

## ලංකා ප්‍රභා ලේඛිකා සංසදයෙන් පනිවිඩයක්

ප්‍රභා ලේඛිකා සංසදයේ ඉදිරි වැඩ කටයුතු වශයෙන් 2012 ජූලි මස 13, 14 සහ 15 යන තෙදින තුළ කාන්තා ඡායාරූප ශිල්පිණියන් හා පාසල් ශිෂ්‍යාවන්ට පමණක් සහභාගි විය හැකි ඡායාරූප ප්‍රදර්ශනයක් හා තරගයක් සංවිධානය කිරීමට බලාපොරොත්තු වේ. කොළඹ ජාතික කලා භවනේ දී පැවැත්වෙන මේ සඳහා අදාළ තොරතුරු පසුව දැනුම් දෙන අතර, තරගය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු ඡායාරූප සූදානම්ව තබා ගන්නා ලෙස පූර්ව දැනුම් දීමක් කෙරේ. ඊට අමතර ව පොදුවේ ඡායාරූප ශිල්පීන්ට වැදගත් වන අන්දමේ දිනක වැඩ මුළුවක් නොමිලයේ පැවැත්වීමට ද ඔවුන් සූදානම් වෙනවා. මේ පිළිබඳ වැඩිදුර විස්තර 0779144798 අංකයෙන් තිනේෂාගෙන් ලබාගත හැකි ය.

## ජයනාත්ගේ Talent Creations වැඩ අරඹයි

අප සංගමයේ සාමාජික ජයනාත් කුමාර ඉලංගකෝන්ගේ නව ව්‍යාපාරික ස්ථානය පසුගියදා කෑගල්ල ලවර්ස් ගොඩනැගිල්ලේ දෙවන මහලේ දී විවෘත විය. මංගල ඡායාරූපකරණය, ඩිජිටල් ඡායාරූප සංස්කරණය ඇතුළු සියලු ම ඡායාරූපකරණ සේවා මෙම ස්ථායයෙන් ලබා ගත හැකි ය. ඔහුගේ ඉදිරි ගමනට සංගමයේ සුබපැතුම් පිරිනමමු.

## ප්‍රකාශන අධ්‍යක්‍ෂ තනතුරේ වෙනසක්

පසුගිය මහා සභා වාරයේ දී ගරු ප්‍රකාශන අධ්‍යක්‍ෂ වශයෙන් තේරී පත් වූ කේ.ජී. කීර්තිරත්න මහතා එම තනතුරෙන් ඉල්ලා අස්වීම නිසා පුරප්පාඩු වූ එම තනතුරට සුනිල් ලියනගේ මහතා පත්කර ගන්නා ලදී. සංගමයේ ව්‍යවස්ථාවට අනුව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ඒ මහතා තෝරාපත්කර ඇත. ඔහුට පිළිසඳරේ සුභපැතුම්.

## අපේ ශෝකය

- කලකට ඉහත සංගමයේ ක්‍රියාකාරි සාමාජිකයෙකු වූ නන්දසිරි ගමගේ මහතා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය එම පවුලේ අය වෙත ප්‍රකාශ කරමු.
- සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වන නෙරංජන් වික්‍රමආරච්චි මහතාගේ ආදරණීය සොහොයුරා අභාවප්‍රාප්ත විය. එම අභාවය පිළිබඳ සංගමයේ ශෝකය පවුලේ සැම වෙත මෙසේ පල කරමු.

## සංගමයේ ඉදිරි පංති කාල සටහන

| | |
|---|---|
| මාර්තු | : 18, 25 (සාමාජික සුහද හමුව) |
| අප්‍රේල් | : 01 (ප්‍රථම මාසික තරගය), 29 |
| මැයි | : 13 (විහාර මහාදේවි උද්‍යාන වැඩ මුළුව), 20 (මාසික තරගය), 27 |
| ජූනි | : 03 (කැලණි විහාරය ප්‍රායෝගික වැඩ මුළුව), 10 (වාර්ෂික එක්දින චාරිකාව), 17, 24 |

අධ්‍යාපන කමිටුවේ නව මාසික ඡායාරූප තරග සංවිධායක ලෙස චින්තක තේනුවර මහතා පත් කර ඇති අතර, ඉදිරි මාසික තරග පිළිබඳ විස්තර ඔහුගෙන් ලබාගත හැකි ය.

## යමුනි ට උපහාර

ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය International Federation of Photographic Art (FIAP) මගින් පිරිනමන ඡායාරූප කලාවේදී සම්මානය වන Artist FIAP (AFIAP) දිනාගත් ප්‍රථම ශ්‍රී ලාංකික කාන්තාව බවට පත් වූ අප සංගමයේ සාමාජිකා යමුනි රශ්මිකා පෙරේරා මහත්මියට විශේෂ උපහාර උත්සවයක් පසුගිය දා පැවැත්විණි. ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් මාර්තු 08 වන දා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී එම උත්සවය පවත්වන ලදී. ප්‍රවීණ ජනමාධ්‍ය ඡායාරූප ශිල්පිණියක මෙන් ම, ශ්‍රී ලංකා ප්‍රභා ලේඛිකා සංසදයේ හිටපු සභාපතිනිය ද වන යමුනි රශ්මිකා පෙරේරා මහත්මියට පිළිසඳර සුභ පැතුම් පිරිනැමේ.

## තෙවන ඇස ඡායාරූප හා මාධ්‍ය ශිල්පීන්ගේ සංගමයේ ඡායාරූප පාඨමාලාව හා ද්වි වාර්ෂික ප්‍රදර්ශනය

තෙවන ඇස ඡායාරූප හා මාධ්‍ය ශිල්පීන්ගේ සංගමය මගින්, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 3 අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සඳහා පවත්වනු ලබන ඡායාරූප පාඨමාලාවට සමගාමීව ඡායාරූප පාඨමාලාවක් පවත්වන අතර, මෙම පාඨමාලාව 2012 මාර්තු මස 18 වන දින ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇත.

එමෙන් ම එම සංගමය මගින් ද්වි වාර්ෂිකව පවත්වනු ලබන ඡායාරූප ප්‍රදර්ශනය මෙවර 2012 අප්‍රේල් මස 27, 28 හා 29 දිනවල පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඡායාරූප පාඨමාලාව හා ප්‍රදර්ශනය පිළිබඳ වැඩිදුර විස්තර 0718013017 අංකයෙන් සමන් ප්‍රනාන්දුගෙන් ලබාගත හැකි වේ.

## කැලණි සරසවියේ ඡායාරූප ශිල්ප ඩිප්ලෝමාවට අයදුම්පත් භාරගැනේ

කැලණිය විශ්වවිද්‍යාලයේ, නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය මගින් පවත්වන ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පාඨමාලාව 2012 ජූනි මාසයේ ආරම්භ කිරීමට නියමිත ය. මෙම එක් අවුරුදු සති අන්ත ඩිප්ලෝමා පාඨමාලාව ඡායාරූප ශිල්පය පිළිබඳ මූලික න්‍යායාත්මක හැදෑරීම්වලින් සහ ප්‍රායෝගික අභ්‍යාසවලින් සමන්විත වූවකි. සති අන්ත ඉරුදින පාඨමාලාවක් ලෙස වසරක් පුරා මෙම අධ්‍යයන ක්‍රියාවලිය පැවැත්වේ.

මහජන බැංකුවේ කැලණිය ශාඛාවේ අංක 05510011 0667549 දරන කැලණිය විශ්වවිද්‍යාලයීය ගිණුමට බැරවන සේ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු. 250/ක මුදලක් ගෙවා ලබාගත් බැංකු රිසිට්පත සමග නම හා ලිපිනය ලියූ රු. 5.00 ක් වටිනා මුද්දර ඇලවූ 9x4 ප්‍රමාණයේ ලියුම් කවරයක් අධ්‍යයන සම්බන්ධීකාරක, ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පාඨමාලාව, නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය වෙත 2012 අප්‍රේල් මස අවසානයේ එවීමෙන් අයදුම්පත් ලබා ගත හැකි ය.